www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදයේ ඓතිහාසික පරිහානිය හා මිලිටරිවාදයේ නැගීම

*දෙ වැනි කොටස*

**The historic decline of the United States and the eruption of militarism**
**Part two**

**නික් බීම්ස් විසිනි**
**2007 පෙබරවාරි 13**

එහි ආර්ථික ආධිපත්‍යය අහිමි වී යැමත් සමග එක්සත් ජනපදය, එන්ට එන්ටම එක් අංශයකින්, එනම් මිලිටරි බලය යෙදීම සම්බන්ධව එය භුක්තිවිඳින ඉමහත් අධිකාරය යොදා ගනිමින් රාජ්‍යාන්තර නායකත්වය පවත්වා ගැනීමට උත්සාහ කරයි.

බුෂ්ගේ විදේශ පිලිවෙතේ ප්‍රතිසංස්කරනයකට පෙනී සිටින විවිධ විවේචකයන්ගේ සැලසුම් ඉදිරිපත්වන්නේ මෙම කාරනයට අදාලවයි.

"ඉරාක මරාලය හා මැදපෙරදිග කරා තල්ලුව" යන ශීර්ෂය යටතේ ජනවාරි 12 දින *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රයේ කතුවැකිය සලකා බලන්න. ලන්ඩන් නගරයේ අවශ්‍යතාවන් නියෝජනය කරන්නේ වී නමුත් පත්‍රය තමන් බුද්ධියේ හඬ යයි සිතාගැනීමට ඇති කැමැත්ත නිසා අනතුරු ඇඟවූයේ, පහරකෑමට ලක් වූ ඉරාකය සුවපත් කිරීමේ සාර්ථකත්වයක් ලබනවාට වඩා, නව ප්‍රතිපත්තිය "අවසන් විය හැක්කේ එක්සත් ජනපදය ඉරානයට කඩාවැදීමෙන් හා අසල්වැසි රටවලටත් බටහිර අගනගරවලටත් උතුරා යා හැකි, නව මට්ටමක ව්‍යසනයකට මැද පෙරදිග ගෙන ඒමෙනි."

නව ප්‍රහාරයට බුෂ්ගේ හේතු දැක්වීම් තරයේ ප්‍රතික්ෂේප කරන කතුවැකිය, "එහි ජීවය සඳහා සටන්වැද සිටින තාරුන්‍යයේ ප්‍රජාතන්ත්‍රවාදයක්" ලෙස ඔහු ඉරාකය රූගත කිරීම ද ඉවත ලයි. "ආක්‍රමනය, අනුග්‍රහයේ ද බියවැද්දීමේ ද පදනම මත ක්‍රියාත්මක වන නිකායන්ට බෙදී ගිය පද්ධතියක් සවිමත් කර ඇත. පාර්ලිමේන්තු සංයුතියෙන් තුනෙන් දෙකක් ම ඉස්ලාමීය වේ. ආයතන ඇත්තේ නැත. අමාත්‍යාංශ වනාහි නිකායික මංකොල්ලයේ මධ්‍යස්ථාන හා කන්ඩායම්ක අට්ටාලයන් ය. අඩු හෝ වැඩි වසයෙන් සදාම් හුසේන් පන ගැටගසා ගත් එක් ආයතනයක් වන ජාතික හමුදාව ආක්‍රමනිකයා විසින් විසුරුවා හරින ලද අතර එය යලි ස්ථාපිත කිරීමට දැන් දරන උත්සාහය යලි ලාංජන පැලඳවූ සන්නද්ධ කන්ඩායමකින් ඔබ්බට ගැනීමට අසමත්ව තිබේ." එය නිමා කරන්නේ "එකම ශක්‍ය ඉදිරි මාවත වන්නේ, එක්සත් ජනපදයේ නව කොන්ග්‍රසය විසින් ද්වීපාර්ශ්වික බේකර්-හැමිල්ටන් කොමිසමේ ප්‍රවිෂ්ටය පිලිගෙන ක්‍රියාවට නැගීමයි. මෙය ඉරාක ආන්ඩුවටත් හමුදාවටත් ජාතික සමගිය ඇති කිරීමේ ඔවුන්ගේ සැබෑ උත්සාහය සඳහා ආධාර වනු ඇති අතර අනෙක් අතට එය ඉදිරියට යැමේ දී එක්සත් ජනපදයෙන් හා ඉරාකයේ අසල්වැසියන්ගෙන් ඩොලර් බිලියන ගනන් දිගුකාලීන ආධාරවලින් පිදුම් ලැබීමට ද හේතු වනු ඇත. තුර්කියේ සිට සවුදි අරාබිය හා ඉරානයේ සිට සිරියාව දක්වා වූ මෙම බාහිර සහයෝගය, ටෙහෙරානය හා ඩැමැස්කස් ද ඇතුලත් කරගත් කලාපය තුල පුලුල් පරිමානයේ රාජ්‍යතාන්ත්‍රික ව්‍යායාමයක් ගොඩනැගීම මගින් සාක්ෂාත් කර ගත යුතු ය. ඒ වෙනුවට බුෂ් මහතා යුද්ධය පැතිරවීමට තර්ජනය කරයි."

මීට පෙර ද මෙවන් යෝජනාවක් කර තිබේ. අවසන් විග්‍රහයේ දී ඒ සියල්ල නතරවන්නේ, ඩොලර් බිලියන ගනන් වියපැහැදම් අඩංගු කර ගත් යම් වර්ගයක මාර්ෂල් සැලැස්මක් මැදපෙරදිග තුල ස්ථාපනය කල යුතු ය යන තැනින් ය. එහෙත් එවන් ව්‍යාපෘතියකින් වාසි ලබන්නෝ කවුරුන්ද? සියල්ලටමත් වඩා ප්‍රන්සය හා ජර්මනිය ද ඇතුලත් එක්සත් ජනපදයේ එදිරිවාදීන් වන පැරනි ධනවාදී බලවතුන් මෙන්ම චීනය හා සමහරවිට රුසියාව වැනි අලුතින් නැගී එන කොටස් ය. මැදපෙරදිග නව නිදහස් වෙලඳපොල තුල දැවැන්ත තෙල් සම්පත් සූරාකෑමෙන් වාසි ලබනු ඇත්තේ ඇමරිකානු සමාගම් නොව ඔවුන්ගේ තරගකරුවන් ය.

තවද, හිටපු ආරක්ෂක උපදේශක බ්‍රෙන්ට් ස්කෝක්‍රොෆ්ට් මෑත පලවූ ලිපියක සඳහන් කලේ එක්සත් ජනපදයේ පසුබෑමක් දුරදිග යන ගෝලීය ප්‍රතිවිපාකයන් ජනිත කරනු ඇති බවයි. ඔහු අවධාරනය කලේ, අයිඑස්ජී වාර්තාව ඉරාකය තුල "බරපතල හා පිරිහෙන" තත්වය ගැන සඳහන් කල ද, ඇමරිකානු හමුදාවන් ඉවත් කර ගැනීමෙන් ඔබ්බට ඉදිරිදර්ශනයක් වර්ධනය කිරීමට අසමත්ව ඇති බවයි. එවන් ඉවත් කර ගැනීමකින් "කලාපය තුලත් ඉන් ඔබ්බටත් විභවාත්මක ව්‍යසනකාරී ප්‍රතිවිපාකයන් සහිතව ඇමරිකානු අවශ්‍යතාවන්ට මූලෝපායික පරාජයක්" ගෙන එනු ඇත.

ප්‍රතිඵල ඉරාකයට හා මැදපෙරදිගට සීමා නොවනු ඇත. ගෝලීය ආර්ථිකයට තීරනාත්මක වන බලශක්ති සම්පත් හා මාර්ගස්ථ ප්‍රවාහන කපොලු බෙහෙවින් වැඩිවන අවදානමකට ලක් වනු ඇත. වෙනත් තැන්වල දී ත්‍රස්තවාදීන් ද අන්තවාදීන් ද දිරිමත් කරනු ඇත. ලෝකය පුරා ඇතිවන්නේ ඇමරිකානු යෝධ කය ඇද වැටී තිබෙන බවත් දිරිය සිඳී ඇති බැවින් තව දුරටත් විශ්වාස කටයුතු මිතුරෙකු හා සගයෙකු ලෙස සැලකිය නොහැකි බවටත් හැඟීමකි. - හෝ මෙම තීරනාත්මක කලාපය තුල සාමය හා ස්ථාවරත්වය සහතික කරන්නෙකු -" වෙනත් වචනවලින් කිවහොත් මිලිටරි ක්‍රියාවලියක් අවශ්‍ය කෙරෙන්නා වූ වැදගත් අවශ්‍යතාවන් පරදුවට තැබී ඇති බවයි.

## නව යටත්විජිතවාදය

එක්සත් ජනපදයේ හිටපු ජාතික ආරක්ෂක උපදේශකයෙකු වූ ස්බිග්නිව් බ්‍රෙසින්ස්කි, බුෂ් පරිපාලනය ගැන විවේචනශීලී වූ විදේශ ප්‍රතිපත්ති කවයන් තුල සිටින එක් අයෙකි. ඔහු බුෂ් ගේ ජනවාරි 10 දින රාජ්‍යතත්ව වාර්තාව පිලිබඳව තවත් විවේචන ඉදිරිපත් කොට තිබේ. ජනවාරි 12 දින වොෂින්ටන් පෝස්ට් පුවත්පතට ලිවූ ඔහු "කතාව අපගේ යුගය පිලිබඳව ප්‍රගාඪ වැරදි වැටහීමකින් යුක්තය. ඇමරිකාව කටයුතු කරන්නේ ඉරාකය තුල යටත්විජිත බලවතෙකු ලෙස ය. එහෙත් යටත්විජිතවාදී යුගය අවසන් ය. පශ්චාත් විජිත අවධියේ දී යටත්විජිත යුද්ධයක් ගෙන යාම ස්වයං පරාජයකි. බුෂ්ගේ ප්‍රතිපත්තියෙහි මාරක දෝෂය එයයි." යනුවෙන් සමාප්ත කලේ ය.

බ්‍රෙසින්ස්කි නිවැරදි ය. පසු ගිය වසර 100 සියලු අත්හදාබැලීම් ව්‍යසනයන් හා පසුබෑම් තිබියදීත් - පන්ති අරගලයේ සියලු පෙරලිකාරිත්වයන් ද - 2007 ලෝකය 1907 වඩා බෙහෙවින් වෙනස් තැනකි. බ්‍රෙසින්ස්කි මත් වෙනත් අවස්ථාවල සඳහන් කර ඇති පරිදි එය අංගලක්ෂිත වන්නේ ලෝක පරිමානව මහජනතාවගේ මැදිහත්වීමකින් ය.

එහෙත් මෙය ප්‍රශ්නය මතුකිරීමක් පමනි: සිය සමස්ත ඉතිහාසය පුරාම තමන් යටත් විජිත විරෝධී බලයක් ලෙස පෙනීසිටි එක්සත් ජනපදය දැන්, ඉරාක විජිතකරනය බාරගෙන ඇත්තේ කුමක් හෙයින් ද?

යටත්විජිතකරනයේ ම ආරම්භය හා ඉතිහාසය, විශේෂයෙන්ම දහනමවන සියවසේ අග හා විසිවෙනි සියවසේ මුල් දශක තුල සිදු වූ විජිතකරනයේ පුපුරා හැලීම සැලකිල්ලට ගනිමින් අපි මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයීමට උත්සාහ කරමු.

1840 ගනන්වල අගමැති වීමට නියමිතව සිටි ඩිස්රේලි යටත් විජිත හැඳින්වූයේ "අප කරවටා එල්ලා ඇති ඇඹරුම් ගල්" ලෙස ය. මෙය බ්‍රිතාන්‍ය නිදහස් වෙලඳාමේ ඉහල ම තුඩ විය. බ්‍රිතාන්‍යයට යටත් විජිත අධිරාජ්‍යයක අවශ්‍යතාවක් නොවූයේ, එය නිදහස් වෙලඳාම මත පදනම් වූ වානිජ්‍ය අධිරාජ්‍යයක් ගොඩනගාගෙන තිබූ බැවිනි. කෙසේ වුවද 19 වන සියවසේ අවසාන කාර්තුව වන විට තත්වය නාටකාකාර ලෙස වෙනස් විය. බ්‍රිතාන්‍යය දැන් නව බලවතුන්ගේ, එනම් යුරෝපා මහාද්වීපයේ දී ජර්මනිය මෙන් ම ඉතාලිය හා ප්‍රන්සය ද, බටහිර දී එක්සත් ජනපදය ද විසින් අභියෝගයට ලක් කලහ.

යටත් විජිතවාදයේ පදනම වූයේ බැහැර කිරීම යි. කොලනියක පාලනය අල්ලා ගත් ඕනෑ ම මහා බලවතෙකුට, එහි වෙලඳපොලෙන් අනෙකුත් සියල්ලන් ඉවත් කල හැකිවිය. බැහැර කිරීමේ මෙම හීතිකාව අනෙක් අතට යටත් විජිත සඳහා තල්ලුවක් ජනිත කලේ ය.

20වන සියවස තුල, එක්සත් ජනපදය ලෝක කරලියට ඇතුල් වූයේ "දොර විවෘත කිරීමේ" පතාකය යටතේ පැරනි අධිරාජ්‍යයන් හා සීමාවන් බිඳ දමමින්; භාන්ඩ හා මුදලේ නිදහස් චලනයක් පිහිටුවීම සඳහා ය. මෙම ප්‍රතිපත්තිය, 19 වන සියවස තුල බ්‍රිතාන්‍යයේ නිදහස් වෙලඳාමේ න්‍යාය පත්‍රය, සුපිරි බ්‍රිතාන්‍ය කර්මාන්තයේ ප්‍රකාශනයක් වූවා සේ ම, සිය එදිරිවාදීන් මත එක්සත් ජනපදයේ සුපිරි බලය ප්‍රකාශිත වීමකි.

මෑත වාර්තා මාලාවකින් සනාථ කර ඇති පරිදි දැන්, එක්සත් ජනපදය ලෝක ගෝලයේ සෑම කොනකදී ම, සිය එදිරිවාදීන්ගේ අභියෝගයට මුහුනපා සිටියි.

2001 පෙබරවාරියේ දී, මූලෝපායික හා ජාත්‍යන්තර අධ්‍යයන කේන්ද්‍රය, (සීඑස්අයිඑස්) "21 වන සියවසේ බල ශක්තිය පිලිබඳ භූ දේශපාලනය" යන හිසින් යුත් වාර්තාවක් සම්පාදනය කලේ ය. එය, හිටපු සෙනෙට් සභික සෑම් නන් හා හිටපු බලශක්ති ලේකම් ජේම්ස් ෂ්ලෙසිංගර් ද ඇතුලත් ද්වි-පාර්ශ්වික කමිටුවක ප්‍රතිපදානයක් විය.

වාර්තාව සටහන් කල පරිදි "බලශක්තිය කරා ප්‍රවිෂ්ටය වටකොට සිටින භූ දේශපාලනික අවදානම් පහව යන බවක් නොපෙනෙන අතර" එම තතු යටතේ, "ලෝකයේ එකම සුපිරි බලවතා ලෙස එක්සත් ජනපදය, ලෝකය පුරා බලශක්ති සැපයුම කරා ප්‍රවිෂ්ටය සුරක්ෂිත කිරීමේ විශේෂ වගකීම් භාරගත යුතු ය."

සීඑස්අයිඑස් වාර්තාව සඳහන් කලේ 21වෙනි සියවසේ මුල් දශක දෙක තුල ලෝක බලශක්ති ඉල්ලුම සියයට පනහකින් පමන ඉහල යනු ඇති බවයි.

"සවුදි අරාබියේ අනභියෝගී ප්‍රමුඛත්වය සහිතව ලෝක තෙල් වෙලඳපොලේ ප්‍රධාන ආන්තික සැපයුම්කරු ලෙස පර්සියන් බොක්ක ප්‍රදේශය පවතිනු ඇත. ඉල්ලුම පිලිබඳ අනාගත ඇස්තමේන්තු සැලකියයුතු තරම් නිවැරදි නම්, පර්සියන් ගල්ෆ් කලාපය 2000-2020 අතර තෙල් නිෂ්පාදනය සියයට 80කින්

පමන ප්‍රසාරනය කල යුතු අතර, විදේශ ආයෝජනයන්ගේ සහභාගිත්වයට ඉඩ සලසන්නේ නම් හා ඉරානය හා ඉරාකය සම්බාධකවලින් නිදහස්වන්නේ නම් මෙය ලඟා කර ගත හැකි ඉලක්කයකි."

මෙම අවශ්‍යතාවය හා වොෂින්ටනයේ පිලිවෙත් අතර විසංවාදය වාර්තාවෙන් සලකුනු කරයි.

"එක්සත් ජනපදය හෝ ජාත්‍යන්තර සංවිධාන විසින් පැනවූ සම්බාධකවලට මුහුන පෑ ජාතීන් තුනේ, එනම් ඉරානය, ඉරාකය හා ලිබියාවේ තෙල් හාගෑස් අපනයනයන් ගෝලීය ඉල්ලුම සපුරාලීමෙහි විශේෂයෙන්ම ආසියාව සමග හා ආසියාව තුල බලශක්ති තරගයක් වැඩී යාම වැලැක්වීමෙහි ලා එන්ට එන්ටම වැඩිවන ක්‍රියා කාලාපයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂිත ය. එක්සත් ජනපදයේ ඒකපාර්ශ්විික සම්බාධක පැනවූ ඉරානයේ හා ලිබියාවේ ආයෝජනයන් එක්සත් ජනපදය සහභාගිත්වයක් නෙමැතිව සිදුවනු ඇත. බහුපාර්ශ්වික සම්බාධකවලට ගොදුරුවූ ඉරාකයට, බලශක්ති ඉල්ලුමේ ඉහලට යොමු වූ වක්‍රයට සරිලන යටිතල පහසුකම් නිසිකලට ගොඩනැගීමෙහි ලා බාධාවක් වනු ඇත. අනෙකුත් සැපයුම් මාර්ග සංවර්ධනය කර නොමැත්තේනම් හා 2020 ඇස්තමේන්තු කර ඇති ගෝලීය තෙල් ඉල්ලුම සැලකියයුතු තරම් නිවැරදිනම් එය තෘප්තිමත් කිරීම සඳහා මෙම අපනයනකරුවන් තිදෙනා ඔවුන්ගේ පූර්න ධාරිතාවෙන් නිෂ්පාදනය කල යුතුය."

වෙනත් වචනවලින් කිවහොත්, ඉරාකය මත පනවා ඇති සම්බාධක ඉවත් කිරීම, එක්සත් ජනපද ධනවාදයේ බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා මෙන් ම එයට ගෝලීය සැපයුම මත පාලනය පවත්වාගැනීම සඳහාත් තීරනාත්මක විය. එහෙත් මෙහි ගැටලුවක් පැවතුනි. හුදෙක් සම්බාධක ඉවත් කිරීම එක්සත් ජනපද පසමිතුරන්ගේ වාසියට හේතු වනු ඇත.

අප දැන් දන්නා පරිදි මෙම ප්‍රශ්නය, 2001 වසන්තයේ පටන් චේනි වටා දැඩි සාකච්ඡාවට බඳුන් විය. අධ්‍යයනයට බඳුන් වූ ලියවිලි අතර "ඉරාක තෙල්බිම් සඳහා විදේශ ඉල්ලුම්කරුවෝ" නම් පිටු දෙකක සටහන ද තිබුනි. රටවල් 30ක තෙල් සමාගම් 63ක් ඉන් හඳුනාගෙන තිබූ අතර, එක් එක් සමාගම ඉරාකයේ කුමන තෙල්බිම ගැන උනන්දුවන්නේ දැයි ද සඳහන්ව තිබුනි. 2003 මාර්තුවේ එක්සත් ජනපද ආක්‍රමනයට පෙරාතුව, බැරල් බිලියන 25ක පොහොසත් මජ්නූන් තෙල්බිම සංවර්ධනය කිරීම සඳහා ටෝටල් එල්ෆ් ඇක්විටේන් නම් ප්‍රන්ස සමාගමේ සැලැස්ම සමග බැග්ඩෑඩය "මූලික එකඟතාවක්" ඇති කර ගෙන තිබූ අතර, ප්‍රධාන එක්සත් ජනපද සමාගම් බොහෝ දුරට දර්ශනපථයෙන් ඉවත්ව සිටිය දී, ඉරාකයේ අනාගත ආයෝජන සඳහා විදේශ තෙල් සමාගම් මනාව සූදානම්ව සිටියහ. සරලව ම සම්බාධක ඉවත් කලේ නම්, ලොකු ම පරාජිතයන් විය හැකිව තිබුනේ එක්සත් ජනපද සමාගම් ය. 2002 ඔක්තෝබරයේ දී ජර්මනියේ ඩොච් බැංකුව විසින් නිකුත් කරන ලද වාර්තාවක් සඳහන් කරන පරිදි, " සම්බාධක ඉවත් කිරීම සඳහා සදාම් හුසේන්, එක්සත් ජාතීන් සමග එකඟතාවකට පැමිනියේ නම් ප්‍රධාන එක්සත් ජනපද සමාගම් පාඩු ලබනු ඇත."

එක්සත් ජනපදය උභතෝකෝටිකයකට මුහුන පා සිටියේ ය. සම්බාධක ඉවත් කිරීම ප්‍රතිසංස්කරන ව්‍යාපෘතීන් මොස්කව් හා පැරිස් වෙත පැවරීමක් වනු ඇත. නොලිහිය හැකි ගැටය කපා හැරිය හැකි එකම මාවත වූයේ, ඉරාක "පාලන තන්ත්‍ර වෙනසක්" ඇති කිරීම හා එක්සත් ජනපද එදිරිවාදීන් බැහැරකිරීමේ පදනම මත යටත් විජිත පාලන තන්ත්‍රයක් පිහිටුවා ලීමයි.

## බලශක්ති සැපයුම හා එක්සත් ජනපද විදේශ පිලිවෙත

විදේශ සම්බන්ධතා කවුන්සිලය (සීඑෆ්ආර්) විසින් පිලියෙල කොට 2006 දී නිකුත්කල අධ්‍යයනයක් පැහැදිලි කල පරිදි, පසුගිය පස්වසර තුල සිදුවී ඇත්තේ එක්සත් ජනපදයේ තත්වයතවත් නරක අතට හැරීම පමනි. ෂ්ලෙසිංගර් ම සභාපතිත්වය දැරූ සීඑෆ්ආර් මන්ඩලයේ වාර්තාව තුල ගැටලුව පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කොට තිබුනි: "බලශක්ති ප්‍රශ්නය වෙත තිරසාර අවධානයක් යොමු නොකිරීම නිසා එක්සත් ජනපද ජාතික ආරක්ෂාවට මෙන් ම විදේශ පිලවෙතට ද වල කැපී තිබේ. රුසියාවේ සිට ඉරානයට හා වෙනිසියුලාව දක්වා වූ ප්‍රධාන බලශක්ති සැපයුම්කරුවන්ට සිය මූලෝපායික හා දේශපාලන අරමුනු කරා යෑමට තම බලශක්ති සම්පත් යොදාගැනීමේ අවශ්‍යතාවයට හා හැකියාවට වඩවඩාත් ඉඩ සැලසී තිබේ."

වාර්තාව අවධාරනය කලේ එක්සත් ජනපදය බලශක්ති ප්‍රශ්නය සම්බන්ධීකරනය පමනක් නොව, සිය විදේශ පිලවෙතට ද ඇතුලත් කල යුතු බවයි.

සීඑෆ්ආර් මන්ඩලය හඳුනාගත් එක් ගැටලුවක් වූයේ තෙලින් පොහොසත් රටවල් තුල චීනයේ ක්‍රියාකලාපය හා චීන වෙලඳපොල සඳහා විශේෂිත සැපයුම් "අගුලු ලාගැනීමේ" එහි උත්සාහයයි. ඊට අමතර සමහර ආන්ඩු "එක්සත් ජනපද අවශ්‍යතාවන්ට හානිකර අරමුනු සඳහා හයිඩ්‍රෝකාබන් අලෙවියේ ආදායම යොදාගනිති." මෙම යථාර්ථයන් නිසා එක්සත් ජනපද ආර්ථික හා ජාතික ආරක්ෂාවට හානිකර මෙම වෙලඳපොල අඩුලුහුඬුකම් නිවැරදි කිරීම සඳහා ක්‍රියාශීලී රාජ්‍ය ප්‍රතිපත්තියක් අවශ්‍යවේ. වෙලඳපොල, ස්වයංක්‍රීයව හොඳම ප්‍රතිඵල ලබා නොදෙනු ඇත."

වාර්තාව කියාසිටින්නේ ඉහල තෙල් මිල හා එක්සත් ජනපද ආර්ථිකයට එහි බලපෑම මෙන් ම, එක්සත්

ජනපද ප්‍රාග්ධන වෙළඳපොළෙහි පෙට්රෝ ඩොලර් සංචිත ගොඩනැගීම කෙරෙහි එහි බලපෑම ද උත්සුකවීම සඳහා ඇති එකම හේතුව නොවන බවයි.

"අපගේ ප්‍රමුඛ උත්සුකතාව පවතින්නේ මෙම සීරුමාරුකිරීමේ ක්‍රියාවලියෙහි ආර්ථික ප්‍රතිවිපාකයන් කෙරෙහි නොව සිය විදේශ කටයුතු පවත්වාගෙන යාමේදී එක්සත් ජනපදයේ ක්‍රියාකාරකම් හා බලපෑම සඳහා වූ නිදහස පහත වැටී තිබීම පිළිබඳවය. එක්සත් ජනපදයේ කටයුතු සීමාවීමට අමතරව, ලෝක තෙල් වෙළඳපොළ තුළ යැපීම හා ආදායම්, ඉරානය හා වෙනිසියුලාව වැනි තෙලින් පොහොසත් රටවල්, එක්සත් ජනපදයට සතුරු විදේශ ප්‍රතිපත්තීන් කෙරෙහි යොමු වීම ශක්තිමත් කර තිබේ."

වාර්තාව කියාසිටින්නේ, තෙල් මෑත අනාගතයේ දී සිදී නොගියත් "සැපයුම තව දුරටත් සංකේන්ද්‍රනය වන්නේ පර්සියන් ගල්ෆ් කලාපය තුළ යයි බලාපොරොත්තු වන අතර එය භූ විද්‍යාත්මකව ලෝකයේ විශාලතම ආකර්ශනීය සංචිතයන් වන" බවයි, "කලාපය අස්ථාවරව පවතින අතර කලින් කලට සිය තෙල් අපනයනයන් එක්සත් ජනපදයට අහිතකර දේශපාලන කර්තව්‍යයන් සඳහා යොදාගන්නා රටවල් ද ඇතුලත්ව තිබෙන" බවයි.

එක්සත් ජනපදය හමුවේ ඇති ගැටලු, වාර්තාව තුළ මෙසේ කැටිකර දක්වෙයිඃ

"...එක්සත් ජනපද අවශ්‍යතාවන්ට හා හර පද්ධතියට එරෙහි ප්‍රතිපතතීන් ක්‍රියාවට නැගීමේ සුනම්‍යතාවය, දවැන්ත තෙල් ආදායම පාලනය කරන තෙල් අපනයන රටවලට ලැබී තිබේ. පරමාණුක අවි ශක්තිය ලබාගැනීම දිශාවට යොමුවූ බව පෙනීයන ක්‍රියාවලියක් ඔස්සේ ඉරානය ගමන් ගනියි. තෙල් හා ගෑස් අපනයනයෙන් ඉමහත් ආදායමක් ලබන බැවින් එහි කොටසක ලෙස රුසියාවට බටහිර ආකල්පයන් නොතකා හැරීමට හැකිවී ඇති අතර, ආඥාදායක ප්‍රතිපත්තීන් කරා යොමු වී ඇත්තේ මූල්‍ය සම්පත් නිසා එම වර්ගයේ ආන්ඩුවක් පවත්වාගෙන යා හැකි බැවින් ය. තෙල් අපනයනයෙන් සම්පත් හිමිවීම නිසා වෙනිසියුලාව, ලතින් ඇමරිකාවේ දේශපාලන සබඳතාවන්ගේ පුනර්ජීවනයක් කැඳවුම් කරන අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජාමුඅ) ආධාරක ගිවිසුමෙන් ආර්ජන්ටිනාව ඉවත්ව යෑම වැනි වෙනස්වීම් සඳහා මූල්‍යාධාර සපයයි. තෙල් හා ගෑස් සම්පත් ජනසතු කිරීමේ බොලීවියානු මෑත තීරනයට ද එයට බලපා තිබේ. සිය තෙල් ආදායම නිසා මේ හා තවත් නිෂ්පාදන රටවල් එක්සත් ජනපදය නොතකා හැරීමේ නිදහස ලබාගෙන ඇති අතර අපගේ ජාතික ආරක්ෂාවට පසමිතුරු ප්‍රතිපත්තීන් අනුගමනය කරති."

තවද, තෙල් මත යැපීම, එක්සත් ජනපදයට පොදු අරමුනු සාක්ෂාත් කර ගැනීම සඳහා අනෙකුන් සමග හවුල්වීමේ හැකියාව සමග ගැටෙන දේශපාලන පුනර්ජීවනයන්ටද හේතු වී තිබේ.

"සමහර විට, වඩාත් පැතිර ගිය බලපෑම මතුව එන්නේ ආනයනයන් මත පදනම් වූ රටවල් දුරදිග නොබලා සැපයුම්කරුවන්ට, වඩා අනුරූපී වන පරිදි සිය පිලිවෙත් නව්‍ය කිරීමෙන් විය හැකි ය. නිදසුනක් ලෙස, චීනය, මැදපෙරදිගදී ඉරානය හා සවුදි අරාබිය වැනි සිය සබඳතාවන් සමගත් අප්‍රිකාවේ දී, නයිජීරියාව හා සුඩානය වැනි රටවල් සමගත් පෙල ගැසෙන්නේ තෙල් සැපයුම් සුරක්ෂිත කර ගැනීමෙහි ලා එහි අවශ්‍යතාවය මත ය. ප්‍රන්සය හා ජර්මනිය සමග යුරෝපීය සංගමයේ එහි බොහෝ දෙනෙක්, රුසියාව හා ඉරානය සමග මතභේදාත්මක ප්‍රශ්න මත ගැටුම් ඇති කර ගැනීමට වඩාත් මැලි වන්නේ ආනයනික තෙල් හා ගෑස් මත ඔවුන්ගේ යැපීම නිසා මෙන්ම එම රටවල ව්‍යාපාරික අවස්ථාවන් ඩැහැගැනීමේ ආශාව නිසා ය.

"මෙම නව පෙලගැසීම් සමග විශේෂයෙන් ම මධ්‍යම ආසියාවේ හා මැදපෙරදිග එක්සත් ජනපද ලීවරය වඩාත් දුබල වී ත්බේ. කසාක්ස්ථානයේ මෙය කැපී පෙනෙයි. රුසියාවේ බලපෑම, සමහර විට ඉදිරි දශකය තුල, වැඩී යනු ඇත්තේ විශාල ප්‍රමානයන්ගෙන් ජපානය හා චීනය වෙත කරන එහි තෙල් හා ගෑස් නිර්යාත හේතු කොට ගෙන ය."

ලෝකයේ අනෙක් සෑම තැනකටම මෙයින් නිකුත් කරන චිත්‍රය කෙසේ විය හැකි ද ? ලතින් ඇමරිකාවේ, මධ්‍යම ආසියාවේ, යුරෝපයේ හා මැදපෙරදිග එක්සත් ජනපදයේ බලපෑම එක්කෝ ඍජු ලෙස නැත්නම් වක්‍ර ලෙස පිරිහෙමින් තිබෙන අතර, එය තෙල් නිෂ්පාදකයන් විසින් හෝ චීනය වැනි නැගී එන බලයන් විසින් අනතුරේ හෙලනු ඇත.

වාර්තාව සකස්කල විශේෂඥ කන්ඩායමේ දෙදෙනෙකුට මෙම නිර්දය චිත්‍රය පවා තියුනු ලෙස ඇඳ නොමැති බව පෙනීගියේ ය. වාර්තාවේ විශ්ලේෂනයට හා තමන් දායක වන බව ප්‍රකාශ කරමින් ඔවුන් අතිරේක දෘෂ්ටියක් ඉදිරිපත් කලහ. ඔවුන්ට පෙනීගිය පරිදි "එක්සත් ජනපදයේ ජාතික ආරක්ෂාවට, තෙල් මත යැපීම නිසා එල්ල වී තර්ජනය (වාර්තාව තුල) අඩුතක්සේරු කර තිබේ."

"බලශක්තිය, එක්සත් ජනපද විදේශ පිලිවෙතට අභියෝග කරන තවත් එක් ප්‍රශ්නයක් නොව ප්‍රධානතම එක ය. මූලෝපායික භාන්ඩයක් වන තෙල්, ප්‍රධානවසයෙන් ම පාලනය කරන්නේ ප්‍රතිගාමී ආන්ඩු හා කාටලයක් වන අතර (ඔපෙක්) ඒවා මිල ඉහල නැංවීම මගින් තෙල් නිෂ්පාදකයන් වෙත ගලා යන බදු කුලී කිහිප ගුනයකින් ඉහල දමයි. මේ තතු තුල තෙල් මත වූ ගෝලීය යැපීම එක්සත් ජනපදයේ බලය හා බලපෑම වේගයෙන් බාදනය කෙරෙයි." මෙම බදු

කුලී ඉරානය ධනවත් කර දිරිමත් කරයි. රුසියාවේ ප්‍රජාතන්ත්‍රවාදයට වලකැපීමට ජනාධිපති ව්ලැඩිමීර් පුටින්ට අවස්ථාව සලසයි. අප්‍රිකාවේ ප්‍රතිගාමී ඒකාධිපතියන් පැලපදියම් කරවයි. සුඩානයේ මිනිස් සංහාරයට එරෙහි පියවර ගැනීම වැලකී යයි. ඇමරිකා දෙකේ (උතුරු හා දකුනු) නිදහස් වෙළඳාමට එරෙහි වෙනිසියුලාවේ උද්සෝෂනයට පහසුකම් සපයයි."

ආර්ථික, දේශපාලන හා මිලිටරි ක්ෂේත්‍ර ද ඇතුලත් සියලු පෙරමුනුවල දී එක්සත් ජනපදය අභිමුඛ කර ඇති එදිරිවාදීන් හා ශක්‍ය විරුද්ධවාදීන්ගේ කොන්දේසි යටතේ එහි ගෝලීය තත්වය පිරිහීයෑම පිලිබඳ විස්තරාත්මක වාර්තාවක් මෙහි දී අප විසින් සම්පාදනය කර ඇත.

එහි ගෝලීය ආධිපත්‍යය රැකගැනීම සඳහා එක්සත් ජනපද මිලිටරි විසඳුම් කරා හැරී ඇත. එහෙත් එවන් ක්‍රියාවන්හි යෙදීම අතීතයේදී පැවති ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ රූපාකාරයන් සමග එකට පෑහෙන්නේ නැත.

1930 ගනන්වල ට්‍රොට්ස්කි පෙන්වා දුන් පරිදි, ජර්මනියේ, ඉතාලියේ හා යුරෝපය පුරා හිස ඔසවමින් ඇති දක්ෂිනාංශික ආඥාදායකත්වයන් හා ෆැසිස්ට් තන්ත්‍රයන්ට එරෙහිව එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය තුල ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතීන් පවත්වාගැනීම, ඇමරිකානු හා බ්‍රිතාන්‍ය පාලක පන්තීන්ගේ ප්‍රජාතන්ත්‍රීය ප්‍රවනතාවයක් නියෝජනය නොකරයි. එංගලන්තයේදී ප්‍රජාතන්ත්‍රවාදය රඳා පැවැත්තේ පාලක පැලැන්තිය විසින් සිය අධිරාජ්‍ය කොල්ලකෑමෙන් ගොඩගසා ගත් සම්පත් මත ය. ඇමරිකාවේ එය රඳාපැවතියේ සමස්ත මහාද්වීපය ම සූරාකෑමෙන් උපුටා ගත් සම්පත් මතය.

21වැනි සියවස ආරම්භයේ දී තත්වය බෙහෙවින් වෙනස්ය. ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන් දැන් එහි සීමාව දක්වාම ඇදීමට ලක්ව තිබේ.

**මතු සම්බන්ධයි.**

© www.wsws.org